# විචර්ලි ඇකඩමියේ රහස් පරීක්ෂිකාවන්



P. H.G. චාමින්ද්‍යා ඉෂාරි ගුණවර්ධන

# විචර්ලි ඇකඩමියේ රහස් පරීක්ෂිකාවන්

P. H.G ටාමින්ද්‍යා ඉෂාරි ගුණවර්ධන
( කතෘ )

පළමු දිගහැරීම.....

මහ/ මහාමායා බාලිකා විදුහල
9 – E ශ්‍රේණිය
2026/05/31

ISBN :– 978–624–211–063–9

# පිදුම

මාගේ ජීවිතයේ ආලෝකය වූ, මා හට ලෝකය දක්නට මගපෙන්වූ මාගේ ආදරණීය දෙමාපියන් වෙතද මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ නියමුවා වන මා දයාබර විදුහල්පතිතුමිය වෙතද මාගේ අධ්‍යාපන කටයුතුවලදී නොමසුරුව දැනුම ලබාදුන් ගුරුතුමියන් සහ ගුරුතුමන් වෙතද මා හට නිරන්තරයෙන් ශක්තියක් වූ මාගේ සහෝදර සහෝදරියන්ටම මෙන්ම යෙහෙළියන් වෙතද කතන්දර ලෝකයේ සැරිසරන්නට ප්‍රිය කරන මා වැනි සහෘද පාඨකයන් වෙතද මා ලියුමේ අකුරු පේළියක් පාසා මට උදව් උපකාර කළ සියලුම දෙනා වෙතට මෙම කෘතිය ආදරයෙන් පිරිනමමි.

# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරන බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදු කරන හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කර හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවාට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමු කරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මාණකරණයෙන් දායක වූ පාසල් දරුවන් මග පෙන්වූ ගුරුභවතුන් ඇතුළු සැමට ස්තූතිය පුදකරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිතුමිය
මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවිඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ ආරම්භ කර ඇති හේමමාලා ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින්
නිර්මාණය වූ ග්‍රන්ථ එළිදැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවරයා වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.
අධ්‍යාපනය යනු මූලික සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා නිර්මාණශීලීත්වය හා බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මගින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.
මෙම ග්‍රන්ථ ගැන ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි එමෙන්ම,මෙවැනි උත්සාහයන් තුලින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.
මෙම සාර්ථක කටයුතු සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ
සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළිදැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලැබෙනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්.අභයකෝන්,
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත,
සම්මානිත මහාචාර්ය,පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026/05/10

# සුභාශිංසන පණිවිඩය

වත්මන් පාසල් පද්ධති තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය වූ ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩම කළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළිදැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය,ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම් කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කීපයක් තිස්සේ සියලු දූ දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමගින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලි චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව.
2026/05/10

# පටුන

01. තවත් එක් අපූරු දවසක් ( 01 - 02 )

02. රහස් පරීක්ෂක කණ්ඩායමක් ( 03 - 07 )

03. නොසිතූ සොරකමක් ( 08 - 12 )

04. දෙවන වරටත් සොරකමක් ( 13 - 17 )

05. සියල්ල විසඳෙන ලකුණු ( 18 - 24 )

06. හොරා කොටුවෙයි ( 25 - 31 )

# තවත් එක් අපූරු දවසක්

මෙය විවර්ලි ඇකඩමි බාලිකා විදුහලේ තවත් එක් අපූරු දවසක්. වෙනදා මෙන් උදෑසන ම තම පාසලට පැමිණෙන අට ශ්‍රේණියේ පන්ති නායිකාව වන ටඩාෂි සහ ඇගේ මිතුරියන් වන ඩෙසී, ඔෂලි, රායා, සැලී, චීසු සහ ගෙසී තම පන්ති කාමරයට පැමිණ ඔවුන්ගේ පොත් බෑග් තම තමන් ඉදගන්නා අසුන් මත තැබූහ. පන්ති නායිකාව පන්ති කාමරයේ සිටි සෑම සිසුවියෙකුටම "සුබ උදෑසනක්" කියා සුබ පතන්නට ද අමතක කලේ නැත. ඇය තම යහළුවන් දෙස බලා මෙසේ කීවා ය.

"ඔයාල දන්නවද? අද නම් මට මාර සතුටු දවසක්."

"ආ.ඇයි අද ඔයාට සතුටු? මට නම් අද දවසේ කිසිම විශේෂයක් පේන්නේ නෑ." චීසු සිනාසෙමින් පන්ති නායිකාවට කීවා ය.

"ඇයි අනේ අද අපිට ප්‍රගති වාර්තා දෙනවනේ."

"ආ ඒකයි මේ. මට ඒත් හිතුනා. ආය කතා දෙකක් නෑ ඔයා තමා පන්තියේ පළවෙනියා."

" විහිළු කරන්නෙ නැතිව ඉන්න චීසු ."

ගැහැනු ළමුන් සිනාසෙන අතරතුරේ පන්තිභාර ගුරුතුමිය වන මිසිස් ජෙනී පන්ති කාමරයට පැමිණියා ය.

"මොකද ළමයි මේ හිනාවෙන්නේ? හරි, හරි දැන් හැමෝම කෑගහන්නෙ නැතුව වාඩිවෙන්නකෝ."

එසේ කියූ ගුරුතුමිය තම අත් බෑගයේ තිබූ තම

පන්තියේ සිසුවියන්ගේ ප්‍රගති වාර්තා පොත් පිටතට ගත්තා ය.

"ළමයි මම දැන් ලෑස්ති වෙන්නේ පන්තියේ පළවෙනියා කවුද කියලා කියන්න. මෙවරත් පන්තියේ පළවෙනියා වෙන්නේ, ටඩාෂි....."

ළමුන්ගේ අත්පොළසන් නාදය මැද පන්ති කාමරයේ ඉදිරියට ගිය ටඩාෂි, ගුරුතුමියගේ දෙපා නමැඳ තම ප්‍රගති වාර්තාව අතට ගත්තා ය. ඉන් පසුව ටම අසුන වෙත ගොස් අසුන් ගත්තා ය.

" මම කිව්වා නේද ඔයා තමයි මේ සැරෙත් පන්තියේ පළවෙනියා කියලා." එසේ කියූ චීසු ටඩාෂිව සතුටින් වැළඳ ගත්තා ය.

# රහස් පරීක්ෂක කණ්ඩායමක්

"අපෝ...අද නම් මහා කම්මැලි දවසක්. කිසි කමකට නෑ." ගෙසී තම මේසය මත වාඩි වී කකුල් සොලවමින් සිටි ගෙසී එසේ කීවා ය. එක් වරම පන්ති නායිකාවගේ කෝපාන්විත  කටහඬ අවදි වූවා ය.

"ගෙසී, මම ඔයාට කී පාරක් කිව්වද මේසෙ උඩ නඟින්න එපා කියලා. අනික මැඩම් කෙනෙක් ආවොත් ඉවරයි."

" හරි මම ඔයා කියන නිසා මේසයෙන් පල්ලෙහාට බහින්නම්. මොනව වුනත් මේ පීරියඩ් එකේ අද මැඩම් එන්නේ නෑ. අද මේ පීරියඩ් එක අපි නිදහස්."

පන්ති නායිකාව පන්තියේ ළමුන් දිහා බැලුවා ය. හැම ළමයෙක්ම ඉතා කම්මැලිකමින් සිටියි.අද දවස කම්මැලි ඉර එළිය වැටී නොමැති නිසා යයි ඇය කල්පනා කළා ය. එහෙත් හදිසියේ යමක් මතක් වූ නිසා ටඩාශි තම යෙහෙළියන් දෙසට හැරී මෙසේ පැවසුවා ය.

"මට ඔයාලට දෙයක් කියන්න තියෙනවා. ඔයාලා දන්නවද අපේ ඉස්කෝලේ අලුතෙන් රහස් පරීක්ෂක කණ්ඩායමක් ආරම්භ කරනවලු. ඒකට දැන් අලුතෙන් ළමයි බඳවා ගැනීම ආරම්භ කරලයි තියෙන්නෙ."

" හැබෑට, කවුද ඔයාට ඕක කිව්වේ? "  සැලී එසේ කීවේ ටඩාෂි දෙස පුදුම සහගත බැල්මක් හෙලමිණි.

" අපේ පන්තිභාර මැඩම් කිව්වේ. පන්තියේ හැදැනුවත් කරන්න කියලත් කිව්වා. මොකද කියන්නේ

අපි හත් දෙනා කණ්ඩායමට බැඳෙමු ද? මම හරි ආසයි ඔය වගේ වැඩවලට. මොකද මගේ යාළුවෝ ටික කියන්නේ? "

" හා අපි ඒකට කැමතියි." ටඩාෂිගේ යහළුවන් එක හඬින් කීවෝ ය.

" එහෙනම් හරි අපි ඒකට පන්තිභාර මැඩම්ගෙන් අවසර ගනිමු. මම පන්තියේ අනිත් අයගෙනුත් අහලා බලන්නම්."

ටඩාෂි පන්තියේ අනෙකුත් ළමයි හැමෝම ඒ පිළිබඳව දැනුවත් කළා ය. එහෙත් අවාසනාවකි. ඔවුන් හත් දෙනා ඇරෙන්නට පන්තියේ අන් කිසිදු ළමයෙකු හෝ ඒ සඳහා කැමති වූයේ නැත.

" එහෙනම් අපි හත්දෙනා යමු. අනිත් අය කැමති නෑනේ." ඔෂලි පන්තිය දෙස දුක් මුසු බැල්මක් හෙලමින් කීවා ය.

මිතුරියන් සත් දෙනා ගුරු විවේක කාමරයට පිවිසීමට තිබෙන පඩිපෙළ නගින අතරතුරේ ටඩාෂි මෙසේ කිරීමටද අමතක කළේ නැත.

" පන්තිභාර මැඩම් ස්ටාෆ් රූම් එකේ ඉන්න ඕන කියලා මම ප්‍රාර්ථනා කරනවා."

"මම හිතන්නෙ ඔයා ප්‍රාර්ථනාව හරියටම කරලා. පොඩ්ඩක් ඉස්සරහ බලන්න."

රායා එසේ කියනවාත් සමඟම ටඩාෂි ඉදිරිපස බැලූවා ය. සැබැවින්ම ඔවුන්ගේ පන්තිභාර ගුරුතුමිය වන මිසිස් ජෙනී ගුරු විවේක කාමරයේ සිටියි. ඔවුහු ඉතා සතුටින් ඇය වෙත දිව ගියහ.

" ආ,මොකද මගේ ළමයි ටික අවේලාවේ මේ පැත්තේ?"

" මැඩම්, ටඩාෂි අපිට කිව්වා ඉස්කෝලේ රහස් පරීක්ෂක කණ්ඩායමක් ආරම්භ කරනවා කියල. ඉතින් මැඩම් අපි හත් දෙනා ඒකට කැමතියි. ටඩාෂි පන්තියේ අනෙක් අයගෙන් ඇහුවා. හැබැයි ඒ අය කැමති වුණේ නෑ. ඒක හින්දා තමයි අපි ටික විතරක් ආවෙ. අනේ මැඩම් අපිට කණ්ඩායමට බැදෙන්න අවසර දෙනව නේද?" ඩේසී ආයාචනාත්මක බැල්මෙන් යුතුව මිසිස් ජේනී දෙස එක එල්ලේ බලාගෙන සිටියා ය.

" හරි හරි ළමයි මම ඔයාලට අවසර දෙනවා."

එම වදන් පෙළ ඇසූ මිතුරියන් සත් දෙනාගෙන් වැඩියෙන් ම සතුටට පත් වූයේ ටඩාෂි ය. එහෙත් මිසිස් ජේනීගේ ඊළඟ වදන් පෙළේ ටඩාෂි හීනෙකින්වත් නොසිතයක් ගැබ්ව තිබුණි.

" ළමයි ඔන්න මම අවසර දුන්නා. දැන් ඔයාලා මිසි මැගේගෙන් අවසර ගන්න ඕනේ. මොකද මම නෙවෙයි රහස් පරීක්ෂක කණ්ඩායමක් ආරම්භ කරන්න යෝජනාව ඉදිරිපත් කළේ ඔයාලගේ විදුහල්පතිතුමිය.දැන් ඉතින් ඔයාල ඉක්මනට ගිහින් විදුහල්පතිතුමියගෙන් අවසර ගන්න." එසේ කියූ ගුරුතුමිය එතනින් පිටව ගියා ය.

සත්තකින්ම මිස් මැගේ යනු විවරලි ඇකඩමි බාලිකා විදුහලේ විදුහල්පතිතුමියයි.තමා මින් පෙර කිසිඳු දිනක විදුහල්පතිතුමිය සමග එක් වචනයක් හෝ කතාකර නොමැත. විදුහල්පතිතුමිය ඉතා කරුණාබර

හදවතකින් යුතු බව ටඩාෂි හොඳවාකාරම දනී.එහෙත් කවමදාවත් බැනුම් අසා නොතිබූ ටඩාෂිට විදුහල්පති තුමිය සමඟ කතා කිරීමට කිසියම් බියක් තිබේ. ඒ එතුමියට ඉතා වැඩ රාජකාරී ගොඩක් තිබියදී ටඩාෂි සහ මිතුරියන් එතැනට පැමිණ තමාගේ වැඩකටයුතු සඳහා බාධාවක් සිදුවන හෙයින් තමාට බැණ වදිනු ඇතැයි සිතා ය. ටඩාෂිට පමණක් නොව, අනෙක් යහළුවන්ට ද කිසියම් බියක් තිබේ. කෙසේ වුවත් තමා බැදෙන්නේ රහස් පරීක්ෂක කණ්ඩායමටයි. එම නිසා බියක් නොමැතිව තමා වෙත පැමිණෙන අභියෝග භාර ගැනීමට ඇයට සිදුවේ. ටඩාෂි තම මිතුරියන් දෙස බලා මෙසේ පැවසුවා ය.

" මම දන්නවා ඔයාලත් බයවෙලා ඉන්නෙ කියලා. හැබැයි බය වෙලා බෑ. දැන් අපි රහස් පරීක්ෂිකාවෝ වෙන්නයි යන්නේ. අපි දැන් හැමෝම හිත හයිය කරගෙන යමු."

එසේ කියූ ටඩාෂි තම මිතුරියන් සමග විදුහල්පති කාර්යාලය දෙසට පියමැන්නා ය. ඉතා අලංකාර ලෙස නිර්මාණය කර තිබූ ඉදිරිපිට නැවතුණ ටඩාෂි දොරට තට්ටු කළා ය. කාර්යාලය තුළින් ඉතා ළයාන්විත කටහඬක් ඇසුණි.

" ඇතුළට එන්න."

මිතුරියන් හත් දෙනා කාර්යාලයට පිවිසුණාහ. ඉතා සුන්දර රූ සපුවකින් සමන්විත තම පාසලේ විදුහල්පති තුමිය ඉදිරිපස හසුනේ අසුන්ගෙන් සිටින අයුරු ඔවුන්ට දැක ගත හැකි විය.

"දැන් හැමෝම ඉඳගන්නකෝ."

මිස් මැගේ තම දකුණු පස තිබූ අසුන් කිහිපයක් ඔවුන්ට පෙන්නුවා ය. මිතුරියන් සත්දෙනා එහි අසුන්ගත්හ.

" මට දැන් කියන්න ඇයි මේ ළමයි මාව හමුවෙන්න ආවේ කියලා." විදුහල්පතිතුමිය ඉතා ආදරණීය ලෙස ළමුන් ඇමතුවා ය.

" මැඩම් මම අට ශ්‍රේණියේ පන්ති නායිකාව මේ ඉන්නේ මගේ හොඳම යාළුවෝ.මැඩර් මිසිස් ජෙනී අපිට කිව්වා ඉස්කෝලේ රහස් පරීක්ෂක කණ්ඩායමක් ආරම්භ කරනවා කියලා. අපි හත්දෙනා කණ්ඩායමට බැඳෙන්න කැමතියි. මැඩම් අපිට අවසර දෙනවා නේද?"

ටඩාෂි සිතේ දෙගෙඩියාවෙන් එසේ කිව්වා ය.

" මට හරිම සතුටුයි මේ ළමයි ගැන මේ වෙනකන් අපේ පාසලේ කිසිම ළමයෙක් මේ කණ්ඩායමට බැඳෙන්න මගෙන් අවසර ගන්න ආවේ නෑ. ඉතින් මේ ළමයින්ට මම අනිවාර්යෙන් ම රහස් පරීක්ෂක කණ්ඩායමේ සාමාජිකත්වය ලබා දෙනවා. "

එසේ කියූ විදුහල්පති තුමිය තව මේසය මත තිබූ සාමාජික කාඩ්පත් කිහිපයක් ගෙන සිසුවියන් හත් දෙනාට ලබා දුන්නා ය. විදුහල්පති තුමියට ස්තූති කළ් යහළුවෝ සත්දෙනා කාර්යාලයෙන් පිටතට පැමිණියහ.

" හුරේ අපි දැන් රහස් පරීක්ෂිකාවෝ." ටඩාෂි කීවා ය.

## නොසිතූ සොරකමක්

" ටඩාෂි, ඔයාගේ අම්මා හදපු කේක් එක නම් මාර රහයි."

ගෙසී තවත් කේක් කෑල්ලක් රස විදින ගමන් එසේ කීවා ය.

මෙය ඔවුන්ගේ විවේක කාලයයි. පන්තිය ඉතා කලබලකාරියි. එක ළමුන් පිරිසක් චෙස් සෙල්ලම් කරයි. තවත් ළමුන් පිරිසක් පොත් කියවයි. තවත් තමුන් පිරිසක් කතාබහ කරමින් සිටියි.අනෙකුත් ළමුන් ආහාර රසවිදිමින් සිටි ආහාර රස විඳින ළමුන් අතරට ටඩාෂි ඇතුළු යහළුවන් සත්දෙනාද ඇතුළත් වෙයි. ඔවුන් ආහාර රස විඳින අතරතුරේ පාසලේ ප්‍රධාන ශිෂ්‍ය නායිකාව වන හිලරි පන්තිය ඇතුලට පැමිණියා ය. ඇය කලබලේ මෙසේ කීවා ය.

" මට සමාවෙන්න ඔයාලට බාධා කරනවාට. ඒ උනාට මේක හදිස්සි අවස්ථාවක්. මේ පන්තියේ පන්ති නායිකාවට ටඩාෂි මෙතන ඉන්නවාද?"

"ඉන්නවා." ටඩාෂි තම අත ඔසවා එසේ කිව්වා ය.

" හරි, ප්‍රින්සිපල් මැඩම් කිව්වා ඔයාටයි ඔයාගේ යාළුවොන්ටයි මැඩම්ගේ කාර්යාලට එන්න කියලා. ඉක්මනින් එන්න කියලත් කිව්වා."

එසේ කියූ ඇය පන්තියෙන් පිටතට ගියා ය.

" ඒ පාර මොනවට එන්න කියනවද දන්නේ නෑ."

චීසු පුදුමයෙන් කිව්වා ය.

" ගිහිල්ලම තමා බලන්න වෙන්නේ."
එසේ කියූ ටඩාෂ තම යෙහෙළියන් සමඟ කාර්යාලය වෙතට පියමන්නා ය. කෝපයෙන් හා දුක්ඛිත මුහුණෙන් හිතුව විදුහල්පතිතුමිය තම පුටුව මත හිඳගෙන සිටියා ය. ඇය ළමුන් හත් දෙනා දුටු ගමන් මෙසේ කීවා ය.
" අනේ බලන්නකෝ වෙලා තියෙන දේ. මේ ළමයිට හොඳ වෙලාවට මම කියපු ආරංචිය ඉක්මනට ලැබිලා."
එසේ කියූ විදුහල්පති තුමිය තම අත දිගු කොට කුසලාන තැන්පත් කර තිබූ රාක්කය පෙන්නුවා ය. දුටු දෙයින් ළමුන් පුදුමයට පත්විය. රාක්කය මුළුමනින් ම හිස්. කවුරුන් හෝ මෙම කුසලාන සොරකම් කර තිබේ. ටඩාශි විදුහල්පති තුමිය දෙස බලා මෙසේ කීවා ය.
" හොරකම සිද්ධ වෙද්දී මැඩම් මෙතන හිටියේ නෑ කියලා මට විශ්වාසයි. මැඩම් කොහෙද ඒ වෙලාවෙ ගියේ?"
අද මට තර්ස්ටන් විද්‍යාලයෙන් ආරාධනාවල් ලැබිලා තිබුණා. ඉතින් මම ආරාධනාව පිළි අරගෙන හරියටම දහයට ඉස්කෝලෙන් ගියා. ආපහු ආවේ පැය භාගයෙන් විතර. එතකොට තමයි මේ දේ සිද්ධ වෙලා තියෙන්නේ."
" මැඩම් ඉස්කෝලෙ නැති වෙලාවේ කාර්යාලයට ආපු අපේ කැන්ටින් එකේ ඉන්න ආන්ටි, ජෝජියාගෙන් මැඩම් මේ ගැන ඇහුවේ නැද්ද?"
"දෙයියනේ ටඩාෂි ඔයා හරියටම කිව්වේ කොහොමද ද මම නැති වෙලාවෙ ජෝජියා මෙහාට ආවා කියලා?"
" මොකද මැඩම් මේ මේසේ උඩ ටී බනිස් එකකුයි, බිස්කටුයි, කිරි තේකකුයි තියෙනවා. අනික දැන් වෙලාව

දහයයි හතළියට විතර ඇති.ජෝජියා මැඩම්ගේ කාර්යාලයට තේ අරගෙන එන්නේ දහයයි කාලට කියලා මම දන්නවා දන්නවා. මැඩම් කියන විදිහට මැඩම් ඒ වෙලේ ඉස්කෝලේ හිටියේ නෑ."

" ටඩාෂි ඔයාගේ අනුමානය හරියට ම හරි. මම ජෝජියාව ගෙනාල්ලා ප්‍රශ්න කරා. එයා කිව්වා එයාට ඒ වෙලාවේ කුසලාන තිබුනද නැද්ද කියලා මතක නෑ කියලා. මම කොළ කෑල්ලක ලියලා ගියා මම ටිකකට එළියට යනවා ඒ හින්දා තේ මේසය උඩින් තියලා යන්න කියලා. ඒක එයා දැකලා. ඒ හින්දා එයා තේ තියල ගිහිල්ලා. හැබැයි එයා කියනවා එළියට එද්දිම පාසලේ කනිෂ්ඨ ශිෂ්‍ය නායිකාවක් ඇතුලට ආවා කියලා."

" එහෙනම් අපිට ප්‍රධාන සැකකරුවන් විදිහට ජෝජියා සහ කනිෂ්ඨ ශිෂ්‍ය නායිකාව සැක කරන්න වෙනවා."

ඔෂලි ස්ථිර හඩකින් කීවා ය. ටඩාෂි ඉන් පසුව මෙසේ කිව්වා ය.

" ඔයා කියන කතාව ඇත්ත. මොනවා වුනත් අපි කාමරයි අවට වටපිටාවයි පරීක්ෂා කරමු. මොකක්හරි හෝඩුවාවක් හම්බවෙයි. ගෙසී, රායා, ඩෙසී ඔයාලා එළිය පරීක්ෂා කරන්න. අපි හතර දෙනා ඇතුළු පරීක්ෂා කරන්නම්. එහෙනම් අපි වැඩ පටන් ගනිමු...."

ඔවුන් ඉතා උනන්දුවෙන් යුතුව පරීක්ෂණ කටයුතුවල නිරත වෙයි. ඔවුන්ගේ එකම අරමුණ වන්නේ කිසියම් හෝඩුවාවක් සොයා ගැනීමයි. එම අතරතුරේ ටඩාෂි ජයග්‍රාහී ලෙස අනිත් යහළුවන් තුන්දෙනා සහ

විදුහල්පතිතුමිය අමතා මෙසේ කිව්වා ය.

" හැමෝම මේ බලන්න ඉක්මනට මෙහාට එන්න."

ඔවුන් හැමදෙනා එතනට රැස්විය. දුටු දෙයින් ඔවුන් විශ්මයට පත්විය. රාක්කයට පිටුපස බිත්තියේ ඉතා විශාල අත් මේස් පැල්ලම් දෙකක් තිබුණි.

" මේ අත් මේ සලකුණුවල ලොකු. මම හිතන්නේ දාසය ප්‍රමාණයේ විතර අත් මේස්. කෝකටත් මැනලාම බලමු."

තම සටහන් පොත අතට ගෙන අත් මේස් පැල්ලම් පිටපත් කරගත් ටඩාෂි කීවේ මෙවැන්නකි.

" ඇත්තටම මේවා දාසය ප්‍රමාණයේ අත් මේස් තමා. ඒ වුනාට මම හිතන්නේ නෑ මේ ඉස්කෝලේ මේ තරම් ලොකු අත් තියෙන අය ඉන්නවා කියලා. කොහොම වුණත් අපිට හැමෝගෙම අත් බල බල යන්න බැහැනේ."

" මිනිස්සුන්ට අත් දෙක කොහේ හරි ඇඟ ඇතුලෙ හංගගෙන යන්න පුළුවන්. ඒත් කකුල් දෙක හංගන්න බැහැනේ.හොරා දාසය ප්‍රමාණය අත්මේස් දානවා නම් අනිවාර්යෙන් ම දාන සපත්තුත් දාසය ප්‍රමාණය වෙන්න ඕනේ. අපි ගොඩක් ලොකු සපත්තු දාන කෙනෙක් දැක්කොත් එයාව සැක කරන්න පුළුවන්."

" ඔයා කියන කතාව හරියටම හරි සැලී. ඒ ක්‍රමය හොඳයි."

" අපිටත් කියන්න දෙයක් තියෙනවා. ඔයාලා වගේම අපිත් එළියෙ දෙයක් හොයාගත්තා. එන්නකො යන්න."

එසේ කියූ ගෙසී සියලු ම දෙනා විදුහල්පති කාර්යාලයට ඉදිරියෙන් ඇති වැලි ඇතිරූ මිදුල දෙසට

රැගෙන ගියහ. කාර්යාලයට පිවිසෙන පඩිපෙළට ආසන්න මිදුලේ කිසියම් සළකුණක් දැක්කට ලැබුණි. බැලූ බැල්මට ඒය ඉරි කෑලි ගොඩක එකතුවකි.එම ඉරි වටේට රවුමක් වැනි කිසියම් සලකුණක් ද තිබුණි. ටඩාෂි ටික වේලාවකට පසු මෙසේ කීවා ය.

" මට නම් හිතාගන්න බෑ මේ මොකක්ද කියලා කෝකටත් අපි මේකත් පිටපත් කර ගනිමු."

එය පිටපත් කරගන්නා අතරතුරේ විදුහල්පතිතුමිය මෙසේ කීවා ය.

" ළමයි ඔයා නම් ගොඩක් දක්ෂයි. ඔයාලා හොඳ හෝඩුවාවල් හොයාගෙන. මොනවා වුනත් ජෝජියයි කනිෂ්ඨ ශිෂ්‍ය නායිකාවයි අපේ සැකකරුවන්ගේ ලැයිස්තුවෙන් අයින් කරොත් හොඳයි. මොකද එයාලට ඒ තරම් ලොකු අත් කකුල් නෑ."

" මැඩම් කියනදේත් හරි.මොනවා වුනත් අපිට ඒ දෙන්නව සැකකරුවන්ගේ ලයිස්තුවේ අයිනකින් තියාගන්න වෙනවා. මොකද හොරකම සිද්ධවෙන වෙලාවෙ එයාල මේ ළගම ඉඳලා තියෙනවා. බයවෙන්න එපා මැඩම්. අපි කොහොමහරි මේ අභිරහස විසදනවා."

ටඩාෂි උද්යෝගිමත් ලෙස කීවා ය.

## දෙවන වරටත් සොරකමක්

" අද නම් හොඳ දවසක් අව්වත් වැටිලා."

එසේ කියන ගමන් රායා පන්ති කාමරයෙන් පිටතට පියමැන්නා ය.

"අද අපේ ඉස්කෝලේ දොළහ ශ්‍රේණියේ අයට විද්‍යා සම්මන්ත්‍රණයක් තියෙනවා. ඉවර වෙන වෙලාවක් දන්නේ නෑ. බැරිවෙලාවත් විද්‍යා මැඩම් එන්න ටිකක් හරි පරක්කු වුනොත් මට මේ පැවරුම දාන්න කිව්වා."

ටඩාෂි පැවරුම පෙන්වමින් එසේ කීවා ය.

" විද්‍යා මැඩම් එන්න විනාඩි දහයක් විතර පරක්කු වෙයිනේ. නෙට්බෝල් මැඩම් මටයි, ඔෂලටයි එන්න කියලා කිව්වා. අපි ඉක්මනින් ගිහින් එන්නම්. ඔයා අපි එනකම් පැවරුම දාන්න."

"හා ඔයගොල්ලෝ ගිහින් එන්න."

එසේ කියූ ටඩාෂි පැවරුම ළමයි වෙත දුන්නා ය. පැවරම දුන් පසු ඇය ද පැවරුම ලියා ගත්තා ය. විනාඩි දහයකට පමණ පසු රායා සහ ඔෂලි කලබලයෙන් පන්ති කාමරයට පැමිණියහ. රායා දුවගෙන විත් ටඩාෂිට මෙසේ පැවසුවා ය.

" ටඩාෂි, අපි දෙන්නා නෙට්බෝල් මැඩම් හම්බවෙලා ආපහු වෙද්දි අපිට ප්‍රින්සිපල්මැඩම්ව හමුවුනා.එයා කිව්වා අපිට පුළුවන් තරම් ඉක්මනින් විද්‍යාගාරයට එන්න කියලා."

" මොකක් හරි හදිස්සියක් ද දන්නෙ නෑ. අපි ඉක්මන්

කරලා යමු." ඉන්පසුව යහළුවන් සත්දෙනා විද්‍යාගාරය වෙත දිව ගිය. එතනට යද්දී ඔවුන් දුටුවේ විදුහල්පතිතුමිය සහ විද්‍යා විෂය භාර ගුරුතුමී විද්‍යාගාරයේ අසල සිට ගෙන සිටින අයුරු ය. විදුහල්පතිතුමිය ඔවුන්ට මෙසේ පැවසුවාය.

" බලන්නකෝ, මේ පාර අපේ විද්‍යාගාරයේ හොරකමක් වෙලා. අන්වීක්ෂ දෙකක් හොරකම් කරන් ගිහින්."

" මොනවා, දෙවැනි පාරටත් හොරකමක්?"

ටඩාෂි පුදුම සහගත ලෙස කීවා ය.

" අන්වීක්ෂ දෙකක් හොරකම් කරන් ගිහින්. මේ හොරානම් ලේසි පහසු හොරෙක් නෙමෙයි."

ගෙසි එසේ කියනවාත් සමඟම සියලු දෙනාම විද්‍යාගාරයට පිවිසුණාහ. ඉන්පසුව ටඩාෂි, රායා, ගෙසී, ඔෂලි විද්‍යාගාරය තුළ පරීක්ෂා කිරීමට පටන් ගත්හ. අනෙක් තුන්දෙනා අවට වටපිටාව පරීක්ෂා කිරීමට පටන් ගත්හ. ඔෂලි විද්‍යාගාරයේ අන්වීක්ෂ තබා තිබූ රාක්කයට පිටුපසින් පිහිටි බිත්තිය දෙස බලා මෙසේ කීවා ය.

" හැමෝම අර බිත්තිය දිහා බලන්න. අපි එදා දැකපු අත් මේස් පැල්ලම් තියෙනවා."

" මේ පැල්ලම් අපි කලින් දැකපු පෑල්ලම් වලට හොඳට ගැලපෙනවා. ප්‍රමාණයත් සමානයි. අර හොරාමයි මේ වැඩෙත් කරලා තියෙන්නේ. මැඩම් මේ හොරකම මෙතන වෙද්දි කවුරුත් හිටියේ නෑ කියලා මට සහතිකයි. මේ හොරකම කීයට විතරද උනේ?"

ටඩාෂි විද්‍යාභාර ගුරුතුමියගෙන් ඇසුවා ය.

" මට හරියටම වෙලාව කියන්න අමාරුයි. මම හිටියේ විද්‍යා සම්මන්ත්‍රණයේ. සම්මන්ත්‍රණය අතරේ විනාඩි දහයක විවේකයක් දුන්නනේ. ඒ අතරේ මම ආපනශාලාවට ගියා කන්න මොනා හරි ගන්න කියලා. එතකොට දහයයි කාලට විතර ඇති. ඒ වෙලාවෙ කැන්ටින් එකේ කවුරුත් හිටියේ නෑ. මොකද ඒ වෙලාවේ කැන්ටින් එකේ වැඩ කරන පෝජියා ස්ටාෆ් රූම් එකට තේ බෙදන්න ගිහින් තිබුණේ. ඊට පස්සේ මම විද්‍යාගාරයට ඇවිත් බලද්දි මේ දේ සිද්ධවෙලා. මම එලියට බැහැලා වටපිට බලද්දි මම දැක්කා පෝජියා තේ දීලා ඉවරවෙලා කැන්ටින් එකට යනවා. මම එයාට විස්තරේ කිව්වා. ඊට පස්සේ අපි දෙන්නම ගිහින් සෝදිසි කරලා බැලුව හොරා ඉන්නවද කියලා. ඒත් හොරා හිටියේ නෑ. ඊට පස්සේ තමා මම මිස් මැගේට කිව්වේ."

ගුරුතුමිය දිගු විස්තරයක් කළා ය.

" ඒ කියන්නේ මේ හොරකම දහයයි කාලට කලින් තමා වෙලා තියෙන්නේ. මැඩම්, ඔයා විද්‍යාගාරෙ දොර වහල ද ගියේ?"

" ඔව් ටඩාෂි. මම දොර වහලා ගියේ."

" එහෙනම් හොරා එන්න ඇති මේ ජනේලයෙන්. මේ ජනේලය ඇරෙන්න වෙන කිසිම තැනකින් විද්‍යාගාරයට ඇතුළු වෙන්න විදියක් නෑ.මට හිතෙන්නේ මැඩම්ට මේ ජනේලය වහලා යන්න අමතක වෙන්න ඇති."

" මට හරියටම මතක නැහැ ජනේලය වැහුවද නැද්ද කියලා. හැබැයි මම පෝජියා එක්ක ඇවිත් බලද්දි

ජනේලෙ වහලා තිබ්බා."

" මේ හොරා කාටවත් පේන්නෙ නැතුව කොහොම හොරකම් කරනවද මං දන්නේ නෑ."

ටඩාෂි බැරෑරුම් ලෙස කීවා ය.

" සමහරවිට නොපෙනෙන හොරෙක් වෙන්න ඇති."

ගෙසී එහෙම කියද්දි සැම දෙනාගේ මුවට සිනහවක් නැඟුනි. ඒත් සමගම ඩෙසී, රායා, සැලී විද්‍යාගාරයට පිවිසුණහ.

" විද්‍යාගාරය ඉස්සරහ තියෙන මල් පාත්තියේ අපි එදා දැකපු අමුතු සලකුණ තියෙනවා. හැමෝම එන්නකෝ බලන්න."

ඔවුන් සියලු දෙනා විද්‍යාගාර ඉදිරිපස පිහිටි මල් පාත්තිය දෙසට ගියහ. සත්තකින් ම එය සැබෑවකි. එදා දුටු සළකුණු මෙන් මෙම සළකුණද ඉරි කෑලි ගොඩක එකතුවකි. ටඩාෂි එම සළකුණ දෙස ඉතා විමසුම් ලෙස බැලුවා ය. ඒ යම්කිසි භාණ්ඩයක් බිම මත පතිත වීමේ සෑදී ඇති සළකුණක් ලෙස ටඩාෂිට සිතුණි. ටික වෙලාවක් කල්පනාවක වැටුණු ඇය කිසියම් දෙයක් මතක් වී ඉතා කලබලයෙන් මෙසේ කිව්වා ය.

" දෙයියනේ, මට දැන් ඒක මතක් උනේ. අපට තව දවස් දෙකකින් ඉස්කෝලේ නිවාඩු දෙනවා නේද?"

" ඇත්ත නේන්නම්. තව දවස් දෙකකින් පාසල් නිවාඩු දෙනවා. එතකොට ඔක්කොම ළමයි ගෙදර යනවා. සේවකයොයි ගුරුවරුයි ඔක්කොම යනවා. එතකොට හොරත් පැනගන්නවා. අපිට ඊට කලින් හොරාව අල්ලගන්න බැරිවෙයිද?"

විදුහල්පතිතුමිය කලබලකාරි හඬකින් කීවා ය.
" බයවෙන්න එපා මැඩම්. අපි කොහොමහරි හොරාව අල්ලගමු."
" මට ඔයාව විශ්වාසයි ටඩාෂි. අපි කොහොම හරි හොරාව අල්ලගමු මේ දවස් දෙක ඇතුළත. හරි, දැන් ඔය ළමයි පන්තියට යන්න. මම මොකක් හරි උවමනාවක් වුනොත් ඔය ළමයින්ට කතා කරන්නම්."
ඉන්පසුව යහළුවන් හත් දෙනා තම පන්ති කාමරය දෙසට පියවර තැබූහ.
" ටඩාෂි, ඔයාට විශ්වාසද අපිට මේ දවස් දෙක ඇතුළත හොරාව අල්ලගන්න පුළුවන් වෙයි කියලා?"
ඩෙසී එසේ විමසුයේ බලාපොරොත්තු කඩවූ විලසිනි.
" මම එහෙම ලේසියෙන් බලාපොරොත්තු අතහරින කෙනෙක් නෙවෙයි. අපි කොහොමහරි හොරාව අල්ලගමු."
ටඩාෂි කීවේ ස්ථිර හඬකිණි.

# සියල්ල විසඳෙන ලකුණු

" මගේ මේ හිස් මොළේට කිසිම අදහසක් එන්නේ නෑ."

ඔෂලි එසේ කීවේ ඉතා දුක්බර ස්වරයකිනි.

" එහෙම කියලා බෑ ඔෂලි. අපි කොහොමහරි මේ හොරා ගැන මොකක් හරි හෝඩුවාවක් දැනගන්න ඕනේ. අපිට තියෙන්නේ අද දවස විතරයි." ටඩාෂි කියා සිටියේ තමා සිටි කල්පනාවෙන් මිදෙමිනි.

මෙය විවර්ලි ඇකඩමියේ තවත් එක් දවසකි. පාසල් නිවාඩුව තව දවසකින් ලබාදෙන හෙයින් පාසලේ ඉගැන්වීම් කටයුතු සිදකරන්නේ ද නැත.ටඩාෂි ඇතුළු යහළුවන් සත් දෙනා ඇර පන්තියේ සිටි සියලුම ළමුන් සෙල්ලම් කිරීම සඳහා පිට්ටනියට ගොස් ඇත. එහෙත් මේ යහළුවන් හත් දෙනා පන්ති කාමරයට වී අහස පොළොව ගැටලන්නට මෙන් කල්පනා කරති. ඔවුන්ගේ අරමුණ කෙසේ හෝ අද දවස ඇතුලත වස්තු සොරා ගත්තේ කවුද යන වග සොයා ගැනීමටයි. හෙට දිනයේදී පාසල් නිවාඩු ලබාදෙයි. මෙය හොරාට ඉතා කදිම අවස්ථාවකි. නිසැකව ම හෙට දින හොරා මේ පාසලේ වටිනා බඩුද රැගෙන පලායයි. මේ සියලු දෙනා කල්පනා කරන අතරේ ටඩාෂි නිහඬතාවය බිද දමමින් මෙසේ පැවසුවා ය.

" අපි මෙහෙම නිකරුනේ කල්පනා කර කර ඉඳලා වැඩක් නැහැ. අපි හැමෝම දැන් එකතුවෙලා කරුණු

එකින් එක පෙළ ගසමු."

එසේ කියූ ටඩාෂි තම සටහන් පොත අතට ගත්තා ය.

" හරි. අපි ඉස්සර වෙලාම විදුහල්පති කාර්යාලයේ සිදුවුන හොරකම ගැන හිතමු. මේ හොරකම සිද්ධ වුණේ දහයයි පහළොවට විතර. එතකොට ප්‍රින්සිපල් මැඩම් ඔෆිස් එකේ හිටියෙත් නෑ. ඒ වෙලාවට ජෝජියා තේ ගේන හින්දා දොර වහලා ගියෙත් නෑ. ප්‍රින්සිපල් මැඩම් තේ මේසය උඩ තියලා යන්නේ කියලා කොල කෑල්ලක ලියලා තිබ්බා. ඒක දැකපු ජෝජියා තේ මේසෙ උඩින් තියලා යන්න ගියා. එතකොට මෙන්න මේ වෙලාවේ තමා හොරකම වෙලා තියෙන්නේ. හැබැයි මේ හොරකම වෙද්දි ජෝජියත් ඒ අවට ඉදල තියෙනවා. ඒත් ජෝජියා දැකලා තිබුණා එයා එළියට එද්දිම කනිෂ්ඨ ශිෂ්‍ය නායිකාවක් විදුහල්පති කාර්යාලය ඇතුළට යනවා යනවා. ඊට පස්සේ අපි ගිහින් පරීක්ෂා කරලා බැලුවනේ, එතකොට අපිට හම්බවුණා දාසය ප්‍රමාණයේ අත් මේස් පැල්ලම් බිත්තියේ තියෙනවා.  එතකොට ඔයාලට මතකද අපිට අර මිදුලේ දකින්න ලැබුණු අමුතු සලකුණ. ඒ සළකුණ හැදිලා තියෙන්නේ මොකක් හරි දෙයක් මිදුල මත පතිත වීම හේතුවෙන්. ඒ මොකක්ද කියලා නම් මට තාම හිතාගන්න අමාරුයි. " ටඩාෂි දිගු පැහැදිලි කිරීමක් කළා ය.

" එතකොට මේ හොරකමේ ප්‍රධාන සැකකරුවෝ හැටියට අපිට ජෝජියයි කනිෂ්ඨ ශික්ෂනායිකාවයි සැක කරන්න පුළුවන්. හැබැයි මෙතන තව එක ප්‍රශ්නයක් තියෙනවා. ඒ දෙන්නට දාසය ප්‍රමාණයේ අත් කකුල් නෑ."

ඔෂලි එසේ කියද් දී ටඩාෂි තම හිස සොලවා එය අනුමත කළා ය.

" අන්න ඒක තමයි මෙතන තියෙන ලොකුම ප්‍රශ්නෙ. ඒ දෙන්නටම දාසය ප්‍රමාණයේ අත් නෑ. මම හිතන්නේ මෙතන අපිට තාමත් නොතේරුණ ලොකු රහසක් තියෙනවා. හරි, අපි දැන් විද්‍යාගාරයේ සිදුවුන හොරකම ගැන බලමු. මේ හොරකම සිද්ධ වුණේ දහයයි පහළොවට විතර. ඒ වෙලාවේ විද්‍යාගාරයේ කවුරුත්ම හිටියේ නෑ. විද්‍යාභාර මැඩම් විද්‍යා සම්මන්ත්‍රණය අතර දුන්න විවේක කාලයේ දී කැන්ටින් එකට ගියේ. ජෝජියා ඒ වෙලාවේ ස්ටාෆ් රූම් එකට තේ බෙදන්න ගිහින් තිබ්බ හින්දා කැන්ටින් එකේ කවුරුත් හිටියේ නෑ. ඒක හින්දා මැඩම් විද්‍යාගාරයට ගිහින් බැලුවා. එතකොට තමා මේ හොරකම සිද්ධවෙලා තියෙන්නේ. එතකොට මැඩම් දැක්කා ජෝර්ජි ආපහු කැන්ටින් එක පැත්තට යනවා. ඊට පස්සේ ඒ දෙන්නම ආපහු ගිහින් බැලුවා හොරා තාම විද්‍යාගාරය ඇතුලේ ඉන්නවද කියලා. ඒත් හොරා හිටියේ නැහැ. මැඩම් විද්‍යාගාර දොර වහලා ගිහින් තිබ්බා. ඒත් හරියටම මතක නෑ ජනේලය වැහුවද නැද්ද කියලා. ඒත් ජෝජියා එක්ක ආපහු ඇවිත් බලද්දී ජලය වහලා තිබ්බා කියලා මැඩම් අපිට කිව්වා. එතකොට කොහොමද මේ හොරා විද්‍යාගාරයට ඇතුළු වුණේ? ඒකට නම් මට හරියට ම උත්තරයක් දෙන්න අමාරුයි. ඊට පස්සේ විද්‍යාගාරය පරීක්ෂා කරද්දි අපිට හම්බ වුණා දාසය ප්‍රමාණයේ අත් මේස් පැල්ලමුයි අර අමුතු සලකුණයි."

ටඩාෂි ඉතා බැරෑරුම් ලෙස කිව්වා ය. ඉන්පසුව සැලී මෙසේ කීවා ය.

" එතකොට මේ හොරකම් දෙකම සිද්ධ වෙද්දි ජෝජියා ඒ ළඟම ඉඳලා තියෙනවා. ඒත් මේ හොරකම් වලට ජෝජියා සම්බන්ධයි කියලා කියන්න අපිට විධිමත් සාක්ෂි නැහැනේ."

" අන්න ඒක තමයි මටත් තියෙන ප්‍රශ්නේ. මටනම් හිතෙන්නෙම මේ හොරකම් වලට ජෝජියාගේ මොකක් හරි සම්බන්ධතාවයක් තියෙනවා. ඒත් අපිට ඒක ඔප්පු කරන්න සාක්ෂි නෑ. අපි අද දවස ඇතුළත ඒ සාක්ෂි කොහොමහරි හොයාගන්න ඕනේ."

එසේ කියූ ටඩාෂි නැවත කල්පනාවට වැටුණා ය.

පන්තිය හා අවට වටපිටාව ඉතා නිස්කලංක ය. ටඩාෂි ඇතුළු යහළුවන් හත් දෙනා හැර පන්තියේ සියලුම ළමුන් ක්‍රීඩා කිරීම සඳහා පිට්ටනියට ගොස් ඇත. ඔවුන්ට ඇසෙන්නේ පන්තියේ තිබෙන ඔරලෝසුවේ කටු කැරකෙන හඬ පමණි. ඒ තරම් ම පන්තිය නිශ්ශබ්ද ය. ඔවුන් සියලු දෙනාම බර කල්පනාවක යෙදී සිටියි. එහෙත් එක්වර ම නිහඬතාවය බිඳිමින් සියුම් ශබ්දයක් ඇසුණි. ඔවුහු සියලු දෙනාම කල්පනාවෙන් මිදී වටපිට බැලූහ. පාසලේ පිරිසිදු කිරීම් කටයුතුවල යෙදෙන කාන්තාවක් පන්තිය ඉදිරිපිට ඇති මිදුල අතුගාමින් සිටියි. ඔවුන්ට ඇසී තිබෙන්නේ එම ශබ්දයයි. ටික වෙලාවක් ඒ දෙස බලාසිටි ටඩාෂි එක්වරම තම අසුනෙන් නැගිට්ටා ය. ඉන්පසුව ඇය රහසින් මෙසේ කීවා ය.

" හැමෝම අර අතුගාන ආන්ටිගෙ අත් දෙක දිහා බලන්න. "

යහළුවෝ හත් දෙනා ඒ දෙස බැලූහ. දුටු දෙයින් ඔවුන් සියලු දෙනා පුදුමයට පත් විය. සැබැවින් ම ඇය ඉතා විශාල අත් මේස් පැළඳ සිටියි. බැලූ බැල්මට එය දාසය ප්‍රමාණයේ අත් මේස් ය. එහෙත් එම කාන්තාව ඉතා සිහින් කෙට්ටු ශරීරයකින් යුක්ත ය. ඉතා කෙට්ටු ශරීරයක් ඇති මෙම කාන්තාවට මෙතරම් විශාල අත් පිහිටා තිබීම අතිශය පුදුමයකි. රායා කලබලයෙන් මෙන් මෙසේ කීවා ය.

" ඒ ආන්ටිගෙ ඇගේ ප්‍රමාණයට සාපේක්ෂව අත් දෙක ගොඩක් ලොකයි. එහෙම වෙන්නෙ කොහොම ද? මේකනම් පුදුමයක්."

" මටත් පුදුමයි. සාමාන්‍යයෙන් එහෙම වෙන්නෙ නෑනේ. කොහොම වුනත් අපි මේ ගැන තව ටිකක් හිතල බලන්න ඕනෙ. කොහොම වුනත් මේ ආන්ටි නම් මේ හොරකම කරේ නෑ කියල මට සහතිකයි."

එසේ කියූ ටඩාෂි තම අසුනේ වාඩිවී නැවත බර කල්පනාවක පැටළුණා ය. විනාඩි දහයක පමණ කාලයක් කල්පනාවක නිරත වී සිටි ඇය එක්වරණ තම අසුනෙන් නැගිට්ටේ සිනාමුසු මුහුණෙනි. ඇයගේ මුහුණ පුන් සඳක් මෙන් එළිය වී බබළයි. ටඩාෂි ඉතා සතුටින් තම යහළුවන් අමතා මෙසේ කිව්වා ය.

" මම හිතන්නේ මම හොරා කවුද කියලා හොයා ගත්තා. "

" මොකක් ඔයා හොරා හොයාගත්ත? කවුද ඒ? අනේ

අපිට කියන්නකෝ."

" ආය කතා දෙකක් නෑ. ඒ තමයි ජෝජියා."

" මට කොහොමත් කලින් ඉදන්ම හිතුනා ජෝජියා වෙන්න ඇති කියලා."

ගෙසී ස්ථිර හඬකින් එසේ කීවා ය. ඉන්පසුව ටඩාෂි මෙසේ කිව්වා ය.

" මට මටත් එහෙම හිතුණා. ඒ වුනාට අපිට කලින් එයාට එරෙහිව සාක්ෂි තිබ්බෙ නෑ. ඒ වුනාට දැන් අපිට ඕනෙවටත් වැඩිය සාක්ෂි තියෙනවා."

" කොහොමද එහෙම වෙන්නෙ. මටනම් ඔයා කියන දේ තේරෙන්නෙ නෑ ටඩාෂි."

" හරි මම ඔයාලට තේරුම් කරලා දෙන්නම්. ඩෙසී ඔයාට පුලුවන්ද දැන් වෙලාව කීයද කියලා කියන්න."

" දැන් වෙලාව එකයි දහයයි."

" දෙයියනේ, ඉස්කෝලෙ ඉවර වෙන්නත් ළඟයි. ඉක්මන් කරල එන්න. අපි මේ දැන්ම මල් ප්‍රින්සිපල් මැඩම් හම්බවෙලා මේ ගැන කියාන්න ඕනෙ."

එසේ කියූ ටඩාෂි තම යහළුවන් සමග විදුහල්පති කාර්යාලයට පිවිසුණා ය. ඉන්පසුව තම යහළුවන්ට මෙසේ පැවසුවා ය.

" ඔයාල මෙතනම ඉන්න. මම ඉක්මනට ගිහින් ප්‍රින්සිපල් මැඩම් හම්බවෙලා ආපහු එන්නම්."

එසේ කියූ ටඩාෂි විදුහල්පති කාර්යාලයට පිවිසුණා ය. ඇගේ යහළුවෝ ඇය නැවත පැමිණෙන තෙක් ඉතා නොඉවසිල්ලෙන් බලා සිටියහ. එහෙත් ටඩාෂි පැමිණෙන්නට මිනිත්තු පහළොවක් පමණ ගත විය.

ටඩාෂි සිනා මුසු මුහුණින් යුතුව තම යහළුවන් දෙසට පැමිණියා ය. ඉන්පසුව ඩෙසී මෙසේ ඇසුවා ය.

" ටඩාෂි ඔයා මොනවාද මෙච්චර වෙලා ප්‍රින්සිපල් මැඩම් එක්ක කතා කරෙ?"

" මම මැඩම්ට කිව්වා හොරා කවුද කියලා. ඊටපස්සෙ මැඩම් කිව්වා හෙට ඉස්කෝලේට පොලීසිය ගෙන්වලා ජෝජියාව අල්ල ගන්නවා කියලා. අපිට හරියටම උදේ දහය වෙද්දී මැඩම්ගෙ ඔෆිස් එකට එන්න කියලා කිව්වා. මැඩම් මගෙන් ඇහුවා කොහොමද හරියට ම නිගමනයකට ආවෙ කියලා. මම කිව්වා දැන් වෙලාවක් නැති නිසා හෙට ජෝජියායි පොලීසියේ මහත්වරුයි ඉන්න තැනම කියන්නම් කියලා. මොකද ඔයාල කියන්නේ? ඒ වැඩේ හොඳයි නේද?"

" ඔව්. ඒ වැඩේ හොඳයි."

යහළුවන් සත් දෙනා එක හඬින් කීහ.

" හරි, එහෙනම් ඔයාල හෙට අනිවාර්යෙන් ම ඉස්කෝලේ එන්න."

එසේ කියූ ටඩාෂි තම යහළුවන් සමග පන්ති කාමරයට ගියා ය.

# හොරා කොටුවෙයි

අද දින යහළුවෝ සියලු ම දෙනා ඉතා වේලාසනින් පාසලට පැමිණියහ. ඔවුන් සියලු දෙනා අද වික්‍රමාන්විත ක්‍රියාවක් සිදු කිරීමටබලාපොරොත්තුවෙන් සිටීම එයට හේතුවයි. යහළුවන් හත් දෙනා පන්තිකාමරයට වී සිටින අතරේ රායා ටඩාෂිට මෙසේ පැවසුවා ය.

" මම මේ ඉවසිල්ලක් නැතුව බලාගෙන ඉන්නේ දහයයි කාල වෙනකම්.අද නම් ජෝජියාට කිසිම ගැලවිල්ලක් නෑ."

" ඔව් ඒකනම්  ඇත්ත. අපිට තව ටික වෙලාවයි ඉවසන්න තියෙන්නෙ. මැඩම් අපිට හරියටම වෙලාවට කතා කරයි."

ටඩාෂි ඇතුළු යහළුවන් සත් දෙනාට පැයක පමණ කාලයක් බලා සිටීමට සිදුවිය.කෙසේ වෙතත් අන්තිම මොහොතේ විදුහල්පතිතුමිය ටඩාෂිගේ පන්ති කාමරය වෙත පැමිණියා ය. ඉන්පසුව මෙසේ කීවා ය.

" ළමයි දැන් අපිට යන්න වෙලාව හරි. ඔයගොල්ලෝ මාත් එක්ක එන්න. මම පොලිසියේ නිලධාරීන් දෙන්නෙකුටත් එන්න කිව්වා. ඒගොල්ලොත් දැන් ඇවිත් ඉන්නේ. "

යහළුවන් විදුහල්පති සමග කාර්යාලයට පිවිසුණාහ. සත්තකින්ම එය සැබෑවකි. ඔවුන් යන විට කාර්යාලයේ පොලිස් නිලධාරීන් දෙදෙනෙක් අසුන්ගෙන සිටියහ. මීට අමතරව ජෝජියාද එහි අසුන්ගෙන සිටියා ය.

ඇය මේ සිදුවෙන කිසිවක් වටහා ගැනීමට නොහැකිව පුදුමයෙන් බලාගෙන සිටියි. ඉන්පසුව විදුහල්පතිතුමිය පොලිස් නිලධාරීන්ට ටඩාෂි ඇතුළු යහළුවන් පිරිස හඳුන්වා දුන්නා ය. විදුහල්පති ඔවුන් හඳුන්වා දුන් පසු පොලිස් මහත්මයෙක් ටඩාෂිගෙන් මෙසේ ඇසුවා ය.

" අපිට මැඩම් හැමදේ ම කිව්වා. ඒත් ඔයා මේ හොරා ඉස්සරහ ම ඒ දේවල් පැහැදිලි කරොත් හොඳයි කියලා මට හිතෙනවා."

" හරි, මම කියන්නම්."

" එහෙනම් කියන්න බලන්න, ඔයා හරියටම ජෝජියා තමයි හොරා කියලා කොහොම ද නිගමනය කළේ කියලා."

" මට මුල ඉඳලම හිතුනා. ඒ මොකද දන්නවා ද? හොරකම සිද්ද වෙන්න කලින් ජෝජියා ඔෆිස් එකට ගියා. එයා ආපහු එද්දී ශිෂ්‍ය නායිකාවක් ඇතුළුට ගියා කියලා ජෝජියා කිව්වා. ඒ වුනාට මට මෙහෙම හිතුණා. ජෝජියා ඇතුළට යන්න කලින් හොරකම සිද්ධ වුණා නම් එයා ඒක දකිනවා. ඊට පස්සේ කාට හරි ඒ ගැන කියනවා. එතකොට අර ශිෂ්‍ය නායිකාව එළියට ආවට පස්සේ හොරකම කරන්න ඉඩ තිබුනෙත් නෑ. ඒ මොකද ජෝජියා කාර්යාලයෙන් පිටතට ඇවිත් විනාඩි පහකට විතර පස්සේ ප්‍රින්සිපල් මැඩම් ආපහු කාර්යාලය ඇතුළට ගියා. එතකොට අනිවාර්යයෙන්ම මේ හොරකම සිද්ධ වුනේ ජෝජියා කාර්යාලය ඇතුලේ ඉන්නකොට. අර ශිෂ්‍ය නායිකාව ගැන කියපු කතාව බොරුවක්. ඒ වුණාට අපිට ඒක ඔප්පු කරන්න සාක්ෂි තිබ්බෙ නැහැ.

එතකොට ඊළඟ හොරකම සිද්ද වෙද්දිත් එහෙමයි. ජෝජියා ඒ ළඟම හිටියා. "

ටඩාෂි තම අදහස් පල කරමින් සිටියදී විටින් විට ජෝජියා දෙස බැලුවා ය. ඇය කිසි ම හැඟීමක් නැති අයෙකු ලෙස බිම බලාගෙන සිටියා ය. එහෙත් එක්වර ම ටඩාෂිගේ කතාවට බාධා කල පොලීස් නිලධාරියා ඇයගෙන් මෙසේ ඇසුවා ය.

" එතකොට මට කියන්න පුළුවන්ද ජෝජියා විද්‍යාගාරයට ඇතුළු වුණේ කොහොමද කියලා. ජනේලයත් වහල තියෙද්දී වහලෙන්ද ඇතුළු වුණේ?"

" නැහැ. එයා ඇතුළු වුණේ ජනේලෙන්මයි. ඔයාලට මතකද විද්‍යා මැඩම් කිව්වා එයා ආපහු ජෝජියා එක්ක ගිහින් බලද්දි ජනේලය වහලා තිබ්බෙ කියල.ඇත්තටම මෙහෙමයි වුණේ. ජෝජියා ජනේලයෙන් විද්‍යාගාරයට ඇතුළු වුණා. ඊටපස්සේ විද්‍යා මැඩම් එක්ක ආපහු ඇතුළට යද්දී මැඩම්ට නොපෙනෙන්න හෙමිහිට ජනේලය වැහුවා. අන්න ඒ විදිහටයි වුණේ. මම කිව්වා හරි නේද ජෝජියා? "

ටඩාෂි එසේ අසද්දී ජෝජියා තම හිස සොලවා එය අනුමත කළා ය. ඉන්පසුව සැලී ටඩාෂිගෙන් මෙසේ ඇසුවා ය.

" එතකොට ටඩාෂි අර දාසය ප්‍රමාණයේ අත් මේස් පැල්ලම් ගැන මොකද කියන්නේ? "

" ආ... තව පොඩ්ඩෙන් මට ඒ ගැන කියන්න අමතක වෙනවා. යාළුවනේ ඔයාලට මතකද මම ඊයෙ අර අතුගාන ආන්ටිගෙ අත් දෙක දිහා බලලා පුදුම වුනා. මම

විතරක් නෙවෙයි. ඔයාලත් පුදුම වුනා. ඒ මොකද , ඒ ආන්ටිගේ ශරීරයේ ක්‍රමානයට සාපේක්ෂව අත්දෙක ලොකු වෙන්නේ කොහොමද කියලා. ඔය ගැන ටික වෙලාවක් මම කල්පනා කර කර ඉද්දි මට මෙන්න මෙහෙම හිතුනා. අපි සමහර වෙලාවට ඇදුම් අදිනකොට ඇගේ ගානට ම තියෙන ඇදුම් අදින්නේ නැහැනෙ. ඇගට ටිකක් හරි ලොකුවට තියෙන ඇදුම්නෙ අදින්නේ. එතකොට අපි අත් මේස් දානකොටත් අතේ ගානටම දාන්නේ නෑනේ. දාසය ප්‍රමාණයේ අත් මේස් කියන්නෙ ගොඩක් ලොකු ඒවා. ඒ අත් මේස් අපි ඕනෙම කෙනෙකුට දාන්න පුළුවන්. හැමෝමට ම තේරුනා ද? "

ටඩාෂි එසේ කියද්දී සියලු දෙනා තම හිස සොලවා එය අනුමත කළහ. මේ අතරතුර පොලිස් නිලධාරියා තවත් ප්‍රශ්නයක් ටඩාෂි වෙත යොමු කළේ ය.

" මට තවත් ප්‍රශ්නයක් අහන්න තියෙනවා. ඒ හොරකම් කරපු කිසිම තැනක අඩි සලකුණු තිබ්බෙ නෑ. අපිත් ඒ තැන් පරීක්ෂා කරා අපිට එහෙම කිසිම දෙයක් හම්බවුනේ නෑ. "

" ඒකත් හොඳ ප්‍රශ්නයක්. ඇත්තටම කිව්වොත් හොරකම සිද්ද වුන තැන් දෙකේ ම තියෙන මිදුලේ මම පොඩි විශේෂත්වයක් දැක්කා. එදා හොරකම සිද්ද වුන දවසේ විදුහල්පති කාර්යාලය ඉස්සරහ තියෙන මිදුලේ වැලි හරිම අක්‍රමවත් විදිහට විසිරිලා තිබ්බා. හරියට නිකම් කවුරුහරි අතින් වලි අවුස්සලා මොනවා හරි දෙයක් හංගන්න උත්සාහ කරනව වගේ සලකුණු තිබ්බා. ඒ තමයි අඩි සලකුණු. ඒ අඩි සලකුණු අපි

දැක්කොත් ජෝජියාගේ හොර වැඩේ අහුවෙනවා. ඒ මොකද අඩි සලකුණු අත් මේස් පැල්ලම්වලට වඩා පොඩි නිසා. ජෝජියා අඩි සලකුණු මකපු නිසා තමයි අපි දැක්කෙ නැත්තේ."

සියලු දෙනා ටඩාෂිගේ මේ අරුම පුදුම කතාවට සවන්දීගෙන සිටින්නේ ඉමහත් පුදුමයෙනි. මේ අතරතුර ගෙසී ටඩාෂිගේ කතාවට බාධා කරමින් මෙසේ ඇසුවා ය.

" එතකොට ටඩාෂි, අර අපි දැකපු ඉරි කෑලි ගොඩක් එකතු වෙලා හැදුණු අමුතු සලකුණ මොකක් ද? අනික ඇයි ජෝජියා අඩි සලකුණු ඔක්කොම මකලා ඒ සලකුණ විතරක් ඉතුරු කළේ? "

" දැන් තමා මේ සිද්දියේ මම ආසම කොටසට එන්නේ. ඒ සලකුණ හැදුනේ ජෝජියා තේ ගෙනියන කූඩයෙන්. එයා හැම හොරකමක් කරද්දිම කූඩය එළියෙන් තියලා ගියේ. කූඩයේ අඩිය පොළොවේ තියෙන වැලිවල වැදිල තමයි ඒ සලකුණ හැදුනේ. අනිත් එක තමයි එයා ඒ සලකුණ මකන්න එච්චර උත්සහ ගත්තේ නෑ. එයා හිතුවා අපිට ඒකෙන් කිසිම ප්‍රයෝජනයක් ගන්න බැරි වෙයි කියලා. ඇත්තටම මට මේ හොරකම කරේ ජෝජියා කියලා හඳුනගන්න ඒ සලකුණත් උදව් වුණා. හරි. මම මගේ පැහැදිලි කිරීම කරලා ඉවරයි. මට මීට වැඩිය යමක් හිතාගන්න බෑ."

" ටඩාෂි, මටත් හිතෙන්නෙ ඔයාගේ පැහැදිලි කිරීම හොඳට ම ප්‍රමාණවත් කියලා. ඇත්තටම මට ඔය ළමයි හත් දෙනා ගැන බොහොම ආඩම්බරයි. ඔයාලා මේ

අභිරහස විසඳුවා. ඔයාලාට ගොඩක් ස්තූතියි ළමයි."

විදුහල්පතිතුමිය ඉතා සතුටින් මෙසේ පැවසී ය. ඒ අතරතුර ටඩාෂි විදුහල්පතිතුමියගෙන් මෙසේ ඇසුවා ය.

" මැඩම් එතකොට හොරකම් කරපු කුසලානවලටයි අන්වීක්ෂවලටයි මොකද උනේ? "

" පොලිස් නිලධාරීන් දෙදෙනා ඉස්කෝලෙට එන්න කලින් ජෝජියාගේ ගෙදර පරීක්ෂා කරා. එතකොට ඒ හොරබඩු ඔක්කොම අහුවුණා."

" මැඩම් මට තවත් ප්‍රශ්නයක් තියෙනවා අහන්න. මේ වුන හොරකම සම්බන්ධයෙන් මැඩම් මුල ඉඳලම පොලීසිය දැනුවත් කරලද තිබ්බේ? "

" ඔහුට ටඩාෂි මම දැනුවත් කරල තිබ්බේ."

" ඇයි එහෙනම් මැඩම් අපිට මේ අභිරහස විසදන්න භාර ගන්න කියලා කිව්වේ? "

" මම එහෙම කළේ ඔය ළමයිගේ දක්ෂතාවය බලන්න. මම මේ හොරකම් දෙකම සිද්ධ වුණ ගමන් ම පොලිසියට කතා කරා. ඒගොල්ලොත් ඇවිල්ලා පරීක්ෂා කරලා බැලුවා. ඊට පස්සේ තමා මම ඔය ළමයින්ට කතා කරේ. ඔයගොල්ලොත් හොයාගත්තේ පොලීසිය හොයාගත්ත හෝඩුවාවල්ම තමා. ඔය ළමයින්ටත් අවස්ථාවක් දීලා බලන්න ඕනෙ නිසා තමයි මම එහෙම කළේ."

" මැඩම්ටත් ගොඩක් ස්තූතියි අපිට මේ වගේ අවස්ථාවක් ලබා දුන්නාට."

ඉන්පසුව පොලීසිය විසින් ජෝජියා අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානය වෙත රැගෙන ගියහ. ටඩාෂි

ඇතුළු යහළුවන් සත්දෙනාට පමණක් නොව විදුහල්පතතුමියට ද සිතට සතුටක් හා සැහැල්ලුවක් දැනේ. සියලු දේ ඉතා සතුටින් අවසන් වූ බැවින් ටඩාෂි තම යහළුවන් සමඟ නැවතත් පන්ති කාමරයට යෑමට සූදානම් විය. එහෙත් විදුහල්පතිතුමිය මොහොතක් රැඳී සිටින මෙන් යහළුවන් හත් දෙනාගෙන් ඉල්ලා සිටියා ය. ඇය මෙසේ කීමට ද අමතක කළේ නැත.

" ළමයි, ඔයාලා අද අපේ පාසලට ලොකු සේවයක් ඉටු කළා. ඒ වෙනුවෙන් මට ඔයාලට දෙන්න පුංචි තෑග්ගක් තියෙනවා."

එසේ කියූ විදුහල්පතිතුමිය තම ලාච්චුව ඇර නිල් පැහැති නිළ ලාංඡන හතක් ගෙන යහළුවන්ට පෙන්වූවා ය. එහි සඳහන්ව තිබුනේ " විවර්ලි ඇකඩමියේ රහස් පරීක්ෂිකාවන් " යනුවෙනි. එය දෙක යහළුවන් හත් දෙනා පුදුමයට පත්විය. ඔවුන් සියලු දෙනාටම කියා නිමකළ නොහැකි සතුටක් ඇති විය. නිළ ලාංඡන අතට ගත් විදුහල්පතිතුමිය ඒවා ළමුන් හත් දෙනගේ පාසල් නිළ ඇඳුම්වල පැළඳ වූවා ය. ඉන්පසුව ඇය මෙසේ කීවා ය.

" අද ඉදලා ඔයාලා තමයි මේ ඉස්කෝලේ නිළ රහස් පරීක්ෂක කණ්ඩායම. මගෙන් ඔයාලට උණුසුම් සුබ පැතුම්!"

"මැඩම් ඔයාට ගොඩක් ස්තූතියි."

යහළුවන් හත් දෙනා එක හඬින් කීවා ය. ඔවුහු විදුහල්පතිතුමියට නැවත වතාවක් ස්තූති කර ඉතා සතුටින් තම පන්ති කාමරය දෙසට පියවර තැබූහ.

නිමි……

# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින් ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමු වීම ව්‍යාපෘති ගමනේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවකුට ලැබෙන ආස්වාදය අන් කිසිවක්වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩාවී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක් සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් "**හේමමාලා උපහාර**" ග්‍රන්ථකරන ව්‍යාපෘතිය දියත් වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටුකල හේමමාලා කුමරියට උපහාර දැක්වීමද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්,විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්,ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලමතුමන් ඇතුළු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සත්කාරය වෙනුවෙන් ස්තුතිවන්ත වෙමු.

සෙනවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)